# දකුණු පළාතේ සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක මඟින් හෙළිවන අතීත විදේශීය ආර්ථික සබඳතා

පී.ආර්. අසංක බුද්ධිකසිරි[70]

---

පුරාවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේ ම තවත් එක් අනු විෂයයක් ලෙස ජලාශ්‍රිත පුරාවිද්‍යාව හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටා තිබෙන නිසා, මෙ රට පවතින භූගෝලීය හා පාරසරික සාධක පදනම් කර ගෙන ප්‍රාග් ඓතිහාසික, මුල ඓතිහාසික, මුල් ඓතිහාසික මධ්‍ය ඓතිහාසික, මධ්‍ය කාලීන, හා පශ්චාත් මධ්‍ය කාලීන යුගයන්වල සිට විදේශීය රටවල් සමඟ වෙළඳ සම්බන්ධතා පැවැති බවට පුරාවිද්‍යාත්මක මෙන් ම සාහිත්‍ය මූලාශ්‍රය සාධක බොහෝමයක් මඟින් අනාවරණය වේ.මේ අධ්‍යයනයේ මූලික ගැටළු ව ලෙස ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලංකාවට හිමි වූ විශේෂ අවධානය පිළිබඳ සාධක සනාථ කිරීම සඳහා සුමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක කෙසේ දායකවේ ද? යන්න අධ්‍යයනය කරනු ලැබේ. ආර්ථික සංකල්පයක සිට බලන කළ ශ්‍රී ලංකාව විදේශීය රාජ්‍යයන් සමඟ කටයුතු කිරීමට පටන් ගත්තේ මූල ඓතිහාසික යුගයේ සිට වූවත් එහි වඩා වර්ධනයක් පෙන්නුම් කරනු ලබන්නේ මුල් හා මධ්‍ය ඓතිහාසික යුගයේ සිට ය. ඓතිහාසික, මධ්‍ය කාලීන, හා පශ්චාත් මධ්‍ය කාලීන යුගයන්වල බෝහෝ විට මේ ස්වභාවය අතිශය වර්ධනය වී ඇති බව සාධක විමර්ශනයෙන් පෙනීයයි. මුහුදු පුරාවිද්‍යාත්මක සාධක මඟින් මෙම ආර්ථික සබඳතා සනාථ කරන පැහැදිලි සාක්ෂි දක්නට ලැබේ. දිවයින වටා පිහිටි වරායන් අතිශය වැදගත් වන අතර ඒ මඟින් ජාත්‍යන්තර ආර්ථික සබඳතා පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලින් පැහැදිලි වේ. මෙම නිබන්ධනයේ මූලික අරමුණ වන ශ්‍රී ලංකාව විදේශීය රටවල් සමඟ පැවති ආර්ථික සබඳතා හෙළිකරන සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක බොහෝමයක් විමර්ශනාත්මක ලෙස අධ්‍යයනය කරමින් ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලංකාවට හිමි වූ විශේෂ අවධානය පිළිබඳ තොරතුරු ගොනු කළ හැකි ය. මෙම අධ්‍යයනය සඳහා අදාළ වන මූලාශ්‍රමය දත්තයන් එක්රැස් කරනු ලැබේ. එය ප්‍රාථමික දත්ත සහ ද්විතීයක දත්ත රැස්කිරීම යන ආකාර දෙක යටතේ සිදු කරයි. ප්‍රාථමික දත්තයන් රැස්කර ගැනීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයන සටහන් තබා ගැනීම, සමුද්‍ර පුරාවිද්‍යා සාධක විශ්ලේෂණය හා සම්මුඛ සාකච්ඡා ආදිය යොදා ගත් අතර ද්විතීයක දත්ත රැස්කරීමේ දී පුස්තකාල පරිහරණය ආශ්‍රිත පොත් පත් සඟරා අන්තර්ජාල භාවිතය ආදිය භාවිත කරන ලදී. අධ්‍යයනයෙන් ලබාගත් අවසන් ප්‍රතිඵලය බහුවිධ මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය භාවිත කර පර්යේෂණ ක්‍රියාවලිය සහ උපකල්පන දත්තයන් ඔස්සේ ඉදිරිපත් කිරීම සිදුකරනු ලදී.

ප්‍රමුඛ පදඃ සමුද්‍ර පුරාවිද්‍යාව, විදේශ වෙළඳාම, සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක

---

70 පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, asanka.buddikasiri8@gmail.com